අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/01/14/06/ALS 11

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2019. 04.08

චක්‍රලේඛ අංක- 23/ 2019

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා

සියලු ම විදුහල්පතිවරුන් වෙත.

**<u>2019 වර්ෂයේ නව විෂය නිර්දේශය යටතේ පවත්වන අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යාව ප්‍රශ්න පත්‍රයේ 10වන ඒකකය ඇගයීමට ලක් නොකිරීම.</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සහ විභාග දෙපාර්තමේන්තුව සමඟ සිදුකරන ලද සාකච්ඡාවේ එකඟතාවය පරිදි හා පාසල් මගින් ලබා ගන්නා ලද තොරතුරු පදනම් කර ගනිමින් 2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ජීව විද්‍යා නව විෂයය නිර්දේශයේ 10වන ඒකකය ඇගයීමට ලක් නොකිරීමට තීරණය කර ඇත. ඒ අනුව 2019 අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී පමණක් ජීව විද්‍යා නව විෂයය නිර්දේශයේ 10වන ඒකකයෙන් ප්‍රශ්න ඇතුළත් කරනු නොලැබේ.

මෙම තීරණය 2019 අ.පො.ස.(උ.පෙළ) විභාගයට නව විෂය නිර්දේශ යටතේ පෙනී සිටින සිසුන් සඳහා පමණක් වලංගු වන අතර 2020 වර්ෂය ඇතුළත් ව ඉදිරියට පවත්වන අ.පො.ස උසස් පෙළ විභාගවල දී ජීව විද්‍යා නව විෂයය නිර්දේශයේ 10වන ඒකකයෙන් ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ.

මේ සම්බන්ධ ව සියලු ම ගුරුභවතුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීම ඔබ විසින් සිදුකළ යුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

එම්. එන්. රණසිංහ

අධ්‍යාපන ලේකම්

පිටපත්,

1. විභාග කොමසාරිස් ජනරාල් - විභාග දෙපාර්තමේන්තුව
2. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය